මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ** වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ)	ප්‍රමිතියේ පරිශිෂ්ය 02 හි ඊ.ජී 2.7 අනුව ක්ෂය කිරීම ගණනය කළ පදනම මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයකළ වටිනාකම මාරු කළ යුතු බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයේ ඉදිකිරීම් අවසන් කළ දිවාසුරකුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සඳහා රු.879,430 ක ක්ෂය ගණනය කර විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි.	නිවැරදි කර ගන්නා බව.	පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රමිතියේ පරිශිෂ්ය 02 හි ඊ.ජී 3.3 අනුව ක්ෂය වීම ගණනය කළ යුත්තේ එය ස්ථාපනය කළ අවස්ථාවේදී සහ එමගින් අපේක්ෂා කළ අරමුණ සඳහා භාවිතා කිරීම සඳහා සූදානම්ව ඇති අවස්ථාවේ සිට බව දක්වා තිබුණද දිවාසුරකුම් මධ්‍යස්ථානය සඳහා සෙල්ලම් අයිතම, උපකරණ, ගෘහභාණ්ඩ හා සවිකිරීම් භාවිතා කිරීම ආරම්භ කිරීමට පෙර සිටම රු.1,431,836 ක් ක්ෂය කර වියදම් සටහනේ විස්තීර්ණ ආදායම් යටතේ දක්වා තිබුණි.	නිවැරදි කර ගන්නා බව.	පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	සේවක ණය සහ අත්තිකාරම් ඇතුළු සියළුම වර්ග වල ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදනයන් ඇති කළ යුතු බව දක්වා තිබුණද එම ශේෂයන් වෙනුවෙන් අඩමාණ ණය වෙන් කිරීමක් සිදු කර නොතිබුණි.	ඉදිරියේදි එලෙස වෙන් කළ යුතු වන්නේ නම් වෙන් කරන බව.	පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සෝලා විදුලි පද්ධති ආදායම රු.190,017 ක් හා විදුලි වියදම රු.210,915 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	ආදායම හා වියදම ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව.	සෝලා විදුලි පද්ධතියට අදාල සියළු ආදායම් සහ වියදම් ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ජංගම බැංකු ගිණුමට ලැබී තිබුණු රු.195,401 ක ස්ථාවර තැන්පතු පොලී මුදල, ස්ථාවර තැන්පතු පොලී ණයගැති ලෙස දක්වා තිබුණි.	නිවැරදි කරගන්නා බව	ස්ථාවර තැන්පත් පොළී නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඇ)	මැදිරිගිරිය වටදාගෙය භූමියේ සනීපාරක්ෂක හා විවේකාගාර පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ කර්මාන්ත ණයගැති හා කර්මාන්ත ණයහිමි වටිනාකම රු.1,173,974 ක් වැඩියෙන් දක්වා තිබුණි.	නිවැරදි කරගන්නා බව.	කර්මාන්ත ණයගැති හා ණයහිමි ශේෂ නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඈ)	ඉකුත් වර්ෂයට අදාලව ලැබී තිබූ රු.224,000 ක විනෝද බදු ආදායමක් ආදායම් ලෙස හඳුනා නොගෙන විවිධ තැන්පතු යටතේ රඳවාගෙන තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විනෝද බදු ආදායම රු.509,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.	නිවැරදි කරගන්නා බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයේ ණයහිමියන් යටතේ දැක්විය යුතු රු.949,618 ක ශේෂ 04 ක් ණයහිමි හා අදාල වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	නිවැරදි කරගන්නා බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඊ)	මැදිරිගිරිය දිවාසුරැකුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙහි වටිනාකම ඉදිවෙමින් පවතින වත්කම් ලෙස දේපල පිරියත උපකරණ යටතේ රු.35,177,198 ක් වැඩියෙන් දක්වා තිබුණි.	නිවැරදි කරගන්නා බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(උ)	විවිධ බාහිර ආයතනවල ප්‍රතිපාදන මත ඉකුත් වර්ෂවල ඉදිකර තිබුණු රු.24,426,556 ක් වටිනා මංමාවත් පාලම් බෝක්කු යටතේ දැක්විය යුතු ව්‍යාපෘති 27 ක වටිනාකම් අතහැරීම හේතුවෙන් දේපල පිරියත උපකරණ ශේෂය හා ප්‍රාග්ධන ආධාර ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	නිවැරදි කරගන්නා බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඌ)	බාහිර ආයතන වලින් ලද මූල්‍ය ප්‍රතිපාදන මගින් ඉදිකළ රු.3,759,045 ක් වටිනා ගොඩනැගිලි, ප්‍රාග්ධන ආධාර ගිණුමෙන් හා ගොඩනැගිලි ගිණුමෙන් අතහැරී තිබුණි.	ගැලපීම් සිදු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

(එ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ආයෝජන ආදායම් වටිනාකම වූ රු.2,080,986 ක් අඩුකර, මුදලින් ලැබුණු ආයෝජන ආදායමේ වටිනාකම වූ රු.1,721,829 ක් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයට එකතුකළ යුතු වුවද, දෝෂ සහගතව රු.668,634 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අඩුකර දැක්වීම පමණක් සිදුකර තිබුණි.	නිවැරදි කරගන්නා බව.	නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.
(ඒ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ලැබිය යුතු දෑ වැඩිවීම රු.55,830,119 ක් වුවද එය රු.67,982,281 ක් ලෙස රු.12,152,162 ක් වැඩියෙන් ද මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී වෙනත් ජංගම වත්කම් වැඩිවීම රු.273,394 ක් වුවද එය රු.947,028 ක් ලෙස රු.673,634 ක් වැඩියෙන් ද ගෙවිය යුතු දෑ වැඩි වීම රු.31,806,381 ක් වුවද, එය රු.38,967,862 ක් ලෙස රු.7,161,481 ක් වැඩියෙන් ද දක්වා තිබුණු අතර වෙනත් ජංගම වගකීම් නොතිබියදී රු.38,413 ක ධන ශේෂයක්ද රු.7,510,820 ක සෘණ ශේෂයක්ද වශයෙන් ශුද්ධ අගය රු.7,472,407 ක සෘණ ශේෂයක් වැඩියෙන් ද දක්වා තිබුණි.	නිවැරදි කරගන්නා බව.	නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.
(ඔ)	ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදි, සමාලෝචිත වර්ෂයේදි මුදල් කරවාගත් රු.10,000,000 ක ස්ථාවර තැන්පතුව සෘණ අගයක් ලෙස දැක්වීම මත, ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.20,000,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.	නිවැරදි කරගන්නා බව.	නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කළ යුතුය.

1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 02 ක වටිනාකම එම ගිණුම් ශේෂවලට අදාල උපයෝගී ලේඛනවල ශේෂ සමඟ සැසඳීමේදී, රු.384,165 ක නොසැසඳීමක් පැවතුණි.	නිවැරදි කර ගන්නා බව.	ගිණුම් පොත්පත් සසදා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන උපලේඛණ 04 ක වටිනාකම එම ගිණුම් ශේෂවලට අදාල උපයෝගී ලේඛනවල ශේෂ සමඟ සැසඳීමේදී, රු. 611,931 ක නොසැසඳීමක් පැවතුණි.	ලේඛන දෝෂ බව.	ගිණුම් පොත්පත් සසදා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1988 අංක 56 දරන හා 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධනය වූ 1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ 23 (ආ) ජේදය	කර්මාන්ත වල අපද්‍රව්‍ය මුදාහැරීම, තැන්පත් කිරීම, වායු විමෝචනය හා කම්පනයන් හා ශබ්ද පිටවීම සඳහා අධිකාරිය ලබාදෙන බලපත්‍රය සෑම වසර 03 කට වරක් අලුත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය වන විට පරිසර ආරක්ෂණ බලපත්‍ර 16 ක් අළුත්කර නොතිබුණි.	කර්මාන්තවල පවතින අඩුපාඩු හා ගාස්තු ගෙවීමට ප්‍රමාදවීම හේතුවෙන් බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි වී ඇති බව.	පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාදීමට කටයුතු කළ යුතුය.
(ආ)	2009 අප්‍රේල් 17 දිනැති 1597/8 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතට වූ සංශෝධන සහිත අතිවිශේෂ ගැසට් පත්‍රය	2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ගොඩනැඟිලි අයදුම්පත් 133 කට අනුමැතිය ලබා දී තිබුණද ඉදිකිරීම් 113 ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි.	අයදුම්කරුවන් දැනුවත් කරන ලද බව.	ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
(i)	මු.රෙ. 371	රු.57,000 ක අත්තිකාරම් 02 ක් මාස 01 ත් දින 06 ක සිට මාස 06 න් දින 27 ක් දක්වා ප්‍රමාදව පියවා තිබුණි.	ඉදිරියේදි නිවැරදි කර ගන්නා බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	මු.රෙ. 571(2)	තැන්පත් වටිනාකම රු.78,728 ක් වූ ඉකුත් තැම්පතු 08 ක් නියාදනය කර නොතිබුණි.	නියාදනය කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඈ)	රාජ්‍ය පරිපාලනය චක්‍රලේඛ			
(i)	1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන හා රාජ්‍ය පරිපාලනය චක්‍රලේඛය	වාහන 08 හා ටේලර් 05 ක බඳෙහි රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි.	ඉදිරියේදි නිවැරදි කර ගන්නා බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	2009 අප්‍රේල් 09 දිනැති අංක 9/2009 දරන රාජ්‍ය පරිපාලන	ප්‍රාදේශීය සභාව ඇඟිලි සලකුණු යන්ත්‍රයේ වාර්තා මත පදනම් නොවී 2024 වර්ෂය සඳහා නිලධාරීන් වෙත	නව ඇඟිලි සලකුණු යන්ත්‍රයක් ලබා ගැනීමට කටයුතු සිදු කරන බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	රු.1,676,221 ක් අතිකාල දීමනා ලෙස ගෙවා තිබුණි.		
(ඉ)	2017 දෙසැම්බර් 21 දිනැති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක 2/2017 දරන වත්කම් කළමණාකරණ චක්‍රලේඛය	වාහන අංගනයේ ආනාරක්ෂිතව ගාල්කර ඇති කැබ්රථයේ අයිතිය පවරා ගැනීමට හෝ අයිතිය තහවුරු වන පාර්ශවයකට භාර දීමට කටයුතු කර නොතිබුණි.	ප්‍රධාන ලේකම් වෙත අවශ්‍ය උපදෙස් පතා ලිපියක් යවා ඇති බව.	වාහන වල අයිතිය පවරා ගෙන භාවිතයට ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.20,980,346 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 32,211,799 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු	රු	රු	රු	රු	රු	රු	රු
(i)	වරිපනම් හා බදු	5,387,230	4,427,379	6,253,025	4,172,118	4,993,116	4,382,673	4,457,112	5,997,764
(ii)	කුලී	12,893,184	9,517,784	8,698,926	1,642,116	15,858,300	7,618,445	10,882,609	823,258
(iii)	බලපත්‍ර ගාස්තු	414,820	544,172	544,172	-	309,800	531,960	531,960	-
(iv)	වෙනත් ආදායම්	5,471,880	4,107,185	4,433,613	248,340	3,127,200	4,835,294	4,785,398	574,768
	එකතුව	24,167,114	18,596,520	19,929,736	6,062,574	24,288,416	17,368,372	20,657,079	7,395,790

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**වරිපනම් හා බදු**		
(i)	1946 අංක 30 දරණ බදු හා තක්සේරු ආඥා පනතේ 20 වැනි වගන්තිය ප්‍රකාරව වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කර වරිපනම් බදු අයකළ යුතු වුවද, එපරිදි කටයුතු නොකර 2013 වරිපනම් තක්සේරුව මත	නව තක්සේරුවක් සිදු කරන බව.	වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කළ යුතුය.

	පදනම්ව අයකිරීම් නිසා තක්සේරුව කාලීනව ක්‍රියාත්මක නොවූ කාලය වසර 06 ක් වී තිබුණි.		
(ii)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.3,045,830 ක වරිපනම් බදු අයවීමට පැවති අතර, ඉන් රු.651,859 ක් වසර 02 සිට වසර 29 දක්වා කාලයක සිට වරිපනම් ඒකක 44 කින් අයවීමට පැවතුණි. රාජ්‍ය ආයතන 20 කින් අයවිය යුතු හිඟ වරිපනම් ආදායම රු.58,327 ක්ව පැවතුණි.	වරිපනම් බදු අයකිරීම් කටයුතු සිදු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් රැස් කර ගත යුතුය.
(ආ)	**කුලී**		
(i)	වසර 11 සිට වසර 30 ක කාලයක සිට අයවීමට පැවති රු.209,354 ක කඩ කුළී හා රථ ගාල් 18 ක කුළී ආදායම් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.	කපාහැරීම සඳහා අනුමැතියට ආණ්ඩුකාරවරයා වෙත දන්වා ඇති බව.	හිඟ ආදායම් රැස් කර ගත යුතුය.
(ii)	වාහන කුළියට ලබාදීම මත වසර 02 සිට වසර 04 දක්වා කාලයක සිට අයවිය යුතු රු.99,999 ක හිඟ ආදායම් ශේෂ 5ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.	අයකර ගැනීමට කටයුතු සිදු කරන බව.	හිඟ ආදායම් රැස් කර ගත යුතුය.
(ඇ)	**වෙනත් ආදායම්**		
(i)	දීර්ඝ කාලයක සිට අයවීමට ඇති රු.556,608 ක හිඟ ජල ගාස්තු ආදායමක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.	හිඟ ජල ගාස්තු ශේෂ තහවුරු කර ගැනීමේ කමිටුවක් පත් කර පරීක්ෂා කරන බව.	හිඟ අදායම් රැස් කර ගත යුතුය.
(ii)	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ලෙස දක්වා තිබුණු, උසාවි දඩ රු.62,593,339 ක් හා මුද්දර ගාස්තු රු.21,349,680 ක් විය.	පලාත් භාණ්ඩාගාරයෙන් ලබා ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති බව.	නියමිත ආදායම් කාල පමාවකින් තොරව ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කරුණු 23 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යාවස්ථා පැනවිය හැකි වුවද 2024 දෙසැම්බර් 31	අවශ්‍ය කටයුතු සිදුකරන බව.	අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතුය.

දින වන විට ප්‍රධාන කරුණු 10 ක් වෙනුවෙන් ව්‍යාවස්ථා පනවා නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් ඌනතා ලෙස හඳුනාගත් භාණ්ඩ අයිතම 13 කට අදාල ඒකක 132 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 760 ප්‍රකාරව හා මුදල් රෙගුලාසි 102 ප්‍රකාරව කටයුතු කර ඉදිරි ක්‍රියාමාර්ග ගෙන වගකිව යුත්තන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.	වගකිව යුත්තන් සොයා අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදුකරන බව.	අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රාදේශීය සභා පනතේ 28 වන වගන්තිය ප්‍රකාරව මාර්ග හඳුනාගෙන ගැසට් කළ යුතු වුවද CGLG ව්‍යාපෘතිය මගින් GPS තාක්ෂණය මගින් මාර්ග මැනීම් සිදුකළද ඒවා ගැසට් කිරීම හා මාර්ග ඉන්වෙන්ට්‍රිය සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.	මාර්ග ඉන්වෙන්ට්‍රිය සකස් කිරීමට කටයුතු කළ බව.	මාර්ග ඉන්වෙන්ට්‍රිය සකස් කළ යුතුය.
(ඇ)	පරිසර බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රාදේශීය සභාවට බලය ඇති කර්මාන්ත 10 කට අදාල ආයතන 900 ක් වෙළඳ හා ව්‍යාපාරික බලපත්‍ර ලබා ගෙන තිබුණද, ඉන් ආයතන 82 ක් පමණක් පරිසර බලපත්‍ර ලබා ගෙන තිබුණු හෙයින් සභාවට රු.3,272,000 කට ආසන්න ආදායමක් අහිමි වී තිබුණි.	කර්මාන්ත සමීක්ෂණයට අනුව පරිසර බලපත්‍ර ලබා දීමට කටයුතු කරන බව.	බලපත්‍ර ලබා ගැනීමට හිමිකම් ඇති සියළුම ආයතන වෙත බලපත්‍ර නිකුත් කළ යුතුය.
(ඈ)	2022 ජුනි 22 දින රු. 114,000කට මිලට ගෙන තිබුණු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ ටයර් 06 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටද යන්ත්‍රයට සවිකිරීමකින් තොරව ගබඩාවේ රඳවා තිබුණි.	මෝටර් ග්‍රේඩරය අළුත්වැඩියා කිරීමෙන් පසු භාවිතයට ගන්නා බව.	අවශ්‍යතාවය හඳුනාගෙන මිළදී ගැනීම් කළ යුතුය.
(ඉ)	ආපදා කළමණාකරණ අමාත්‍යාංශයෙන් ලැබී තිබූ මෝටර් බෝට්ටුවක් හා එන්ජිමෙහි අගය තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ ගිණුම තුල වත්කම් යටතේ ඇතුලත් කරන බව.	වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 30,873,442 ක වත්කම් ශේෂ 03 ක්, ආදායම් ශේෂ 02 ක් හා වියදම් ශේෂයක විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.	විගණනයට අවශ්‍ය සියළු ලිඛිත සාක්ෂි ලබා දෙන බව.	කේවල ශේෂ ඇතුලත් උපලේඛන ඉදිරිපත් කළ යුතුය.

3.3 ඌණ උපයෝජිත වත්කම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභාව සතු එකතුව රු.67,427,409 ක වත්කම් අයිතම 17 කට අදාල ඒකක 43 ක් විවිධ හේතු මත ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.	වෙන්දේසිය කිරීමට හා උපයෝජනය කිරීමට කටයුතු කරන බව.	වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	උතුරුමැද ප්‍රධාන ලේකම් විසින් භාරදී තිබූ වර්ෂ 21 කට අධික කාලයක් අක්‍රීයව සහා භූමියේ ගාල්කර තිබූ කැබ්රථය සුදුස්සක් කොට බැහැර කිරීමට කටයුතු නොකර අනාරක්ෂිතව ගාල්කර තිබුණි.	වාහනයෙහි පොතෙහි පිටපත සමග යාන්ත්‍රික ඉංජිනේරු වෙත යොමු කරන බව දන්වා ඇත.	සුදුසු පරිදි වත්කම් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	බැකෝ ලෝඩරය 2023 දෙසැම්බර් 15 දින වම් පස පැති දොරෙහි වීදුරුව බිඳියාම මත සිදු වූ රු.146,125 ක අලාභය සම්බන්ධව මුදල් රෙගුලාසි 104 (3) ප්‍රකාරව වූ වාර්ථා දෙකම 2023 දෙසැම්බර් 22 දින සකස්කර තිබුණි. මෙම අලාභය සඳහා රක්ෂණ සමාගම මහින් රු. 60,000 ක් පමණක් ප්‍රතිපූර්ණය කර තිබු බැවින් රු.86,125 ක අලාභය අයකර නොතිබුණි.	අදාල වාර්තා නිවැරදි දින වකවානු වලදී සකස් කර ගැනීමට කටයුතු කරන බව දක්වා ඇති බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.5 ප්‍රසම්පාදනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 වගන්තිය ප්‍රකාරව නිශ්චිත පිරිවිතර නොදක්වා වටිනාකම රු.76,000 ක් වු ඩොට් මෙට්‍රික් ප්‍රින්ටරය මිලදි ගැනිම සඳහා මිල කැදවා තිබුණි.	නිශ්චිත පිරිවිතරයක් සකස්කිරීමට කටයුතු කරන බව.	නිශ්චිත පිරිවිතර යටතේ මිළදී ගැනීම් සිදු කළ යුතුය.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

මැදිරිගිරිය දිවා සුරකුම් මධ්‍යස්ථානය ඉදිකිරීමේ උප ව්‍යාපෘතිය - රු.25,389,812

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 හා 8.12.2 අනුව කොන්දේසිවලට අනුකූලව වැඩ ඉටුකර ඇති බවට සහතික වීමෙන් අනතුරුව ගෙවීම් කළ යුතු වුවද රු.1,687,073 ක් ඉටු නොකළ වැඩ අයිතම 04 ක් සඳහා ගෙවීම් කර තිබුණි.	නොකල වැඩ කොටස් ඉටුකරවා ගත් බව.	නොකල වැඩ කොටස් ඉටු කල බවට සහතික කල නිළධාරීන් සම්බන්ධව විනයානුකූලව කටයුතු කළ යුතුය.

(ආ)	ප්‍රමාණ පත්‍ර අයිතම අංක 04 යටතේ Laminated Plywood Shuttering යොදා ගෙනඇති බැවින් එම සුමට පෘෂ්ඨ මත නැවත 15mm ඝනකමින් යුතු Plaster යෙදීම අවශ්‍යතාවයක් නොතිබියදී වැඩ අයිතම V-2 යටතේ Plaster වැඩ විෂයය ඇතුළත් කර රු. 732,152 ක් අනාර්ථිකව ගෙවා තිබුණි.	ඉහළ මහල ඉදිකිරීම සම්බන්ධ තීරණයක් නොතිබූ හෙයින් දලඹ කපරාරුව සිදුකරන ලද බව.	අනාර්ථික ගෙවීම් සම්බන්ධයෙන් නැවත පරීක්ෂා කර බැලිය යුතුය.
(ඇ)	ප්‍රමාණ පත්‍ර අයිතම අංක 19 යටතේ Toilet Floor & Wall සහ Balcony යන කොටස් Water proof කිරීම සඳහා අවශ්‍ය වර්ග මීටර් 155 ක් වෙනුවට 624.13කට ඇස්තමේන්තු ප්‍රමාණයද ඉක්මවා රු.1,243,195 ක් අනාර්ථිකව ගෙවා තිබුණි.	ඉහළ මහල ඉදිකිරීම සම්බන්ධ තීරණයක් නොතිබූ හෙයින් සම්පූර්ණ කොටසම Water proof කල බව.	-එම-
(ඇ)	කොන්ත්‍රාත් විචලනයන්ගේ වටිනාකම රු.7,945,353 ක් මූලික කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 35 ක් පමණ වන බැවින් ඇස්තමේන්තු සකස් කිරීම සහ ඒවා අනුමත කිරීම ඉතා දුර්වල මට්ටමක පැවතුනි.	ව්‍යුහගත සැලැස්මේ සිදු වූ වෙනස් කම් මත ප්‍රමාණයන් වෙනස් වී ඇති බව.	නිවැරදිව ඇස්තමේන්තු කළ යුතුය.
(ඉ)	මෙම ව්‍යාපෘතියට අදාළව කිසිදු තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීමකින් තොරව කොන්ක්‍රීට් වැඩ ඝන මීටර් 101.6 සඳහා රු.4,507,890 ක් ගෙවීම් කර තිබුණි.	තත්ත්ව පරීක්ෂණ වාර්ථා ඉදිරිපත් කර ඇති බව.	ගෙවීම් කිරීමට පෙර තත්ත්ව පරීක්ෂණ වාර්ථා ලබා ගත යුතුය.

3.7 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය සභාවේ තනතුරු 11කට අදාල නිලධාරීන් 13 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර කාර්යාල කාර්ය සහායක හා පුස්තකාල සහායක තනතුරු සඳහා නිළධාරීන් 02 ගේ අතිරික්තයක් පැවතුණි.	පිළිගන්නා බව.	පුරප්පාඩු සපුරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රාදේශිය සභාවේ පුස්තකාල සහයක,මාර්ග කම්කරු, රියදුරු,කාර්යාල කාර්යය සේවයේ තනතුරුවල සේවයකරන නිලධාරීන් 18 දෙනෙකු තම නිත්‍ය තනතුරුවලට අදාල නොවන කළමණාකරණ සේවා, ආදායම් පරීක්ෂක, රියදුරු, මුරකරු,පෙරපාසල් පාලිකා හා පුස්තකාල සහයක තනතුරුවල රාජකාරී වසර 01 සිට වසර 10 ක කාලයක සිට ඉටුකරමින් පැවතුණි.	පුරප්පාඩු පවතින බැවින් හා අවශ්‍ය රාජකාරි ඉටු කරවා ගැනීමට සිදුව ඇති බව.	නිත්‍ය තනතුරුවලට අදාල රාජකාරී පැවරිය යුතුය.
(ඇ)	ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ජේදයේ 4.4 හා 4.6 ජේද සහ 2019 ජුලි 27 දිනැති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ජේදය ප්‍රකාරව මියගිය නිළධාරියෙකුගේ අයවිය යුතු රු.32,679 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	කපා හැරිමට නොහැකි මුදල් කපා හැරිම සඳහා ආණ්ඩුකාර අනුමැතිය ලබා ගැනිම සඳහා ඉදිරිපත් කර ඇති බව.	ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ)	සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා දායක මුදල් ගෙවීමේදි රු. 94,784 ක් අර්ථසාධක අරමුදල් ලෙසද රු.14,218 ක් සේවා නියුක්තිකයන්ගේ භාර කාර අරමුදල් ලෙසද එකතුව රු.109,002 ක් දායක මුදල් අඩුවෙන් ගෙවා තිබුණි.	දායක මුදල් ගෙවිමේදි මුළු ඉපයිම් මත ගණනය කිරීමට කටයුතු කරන බව.	දායක මුදල් මුළු ඉපයිම් මත ගණනය කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2015 මාර්තු 18 දිනැති උතුරුමැද පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ අංක 4/2015 හි 1.3 ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිළධාරියෙකු පත්කර සෑම මසකම අවසානයේදීම මහා සභාවට වාර්ථාවක් ඉදිරිපත් කල යුතු වුවද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර ආයතනයේ කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීමට සහයක් ලබා දී නොතිබුණි.	හදුනාගන්නා ලද ගැටළු වලදී අභ්‍යන්තර විමර්ෂණයක් සිදුකරන බව.	ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වියදම් විෂයන් 35 ක් සඳහා සලසා තිබුණු රු.3,870,600 ක සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම ඉතිරි කර තිබූ අතර තවත් වැය විෂයයන් 93 ක සලසා දී තිබූ ප්‍රතිපාදන මුදල රු.200 සිට රු.5,964,534 ක එනම් සියයට 1 සිට සියයට 98 දක්වා පරාසයක ඉතුරු වීම් පැවතීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය මහපෙන්වීමක් ලෙස භාවිතා කර නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අයවැය ලේඛණය මූල්‍ය මහපෙන්වීමක් ලෙස භාවිතා කළ යුතුය.

4.3 පාරිසරික ගැටළු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
යුදගනාව පිළිසරු අංගනයේ නිෂ්පාදනය වෙමින් පවතින පොහොර තොග වටිනාකම ගණනය කර ගිණුම්ගත කිරීමට ක්‍රමවේදයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද සකස්කර නොතිබුණි.	තරාදි පහසුකම් නොමැති විම හේතුවෙන් තොගය ගණනය කිරීමට නොහැකි වි ඇති බව.	වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

4.4 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ නියාමනය අනුව ප්‍රාදේශීය සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු, වැඩසටහන් හා නිර්ණායක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමක් සිදු කර නොතිබුණි.	හඳුනාගත් වැඩසටහන් සිදු කරන බව.	පනතේ දක්වා ඇති අරමුණු හා වැඩසටහන් වලට අනුකූලව කටයුතු කළ යුතුය.